ශ්‍රී ලංකා මානව හිමිකම් කොමිෂන් සභාව
இலங்கை மனித உரிமைகள் ஆணைக்குழு
**HUMAN RIGHTS COMMISSION OF SRI LANKA**


| | | |
|---|---|---|
| මගේ අංකය / எனது இல. / My No. | ඔබේ අංකය / உமது இல. / Your No. | දිනය / திகதி / Date 2022/01/20 |

**පැමිණිලි පාර්ශවය** : එස්. ටී. නලීර් මයා.
257/2 ඒ, ටොරින්ටන් මාවත,
කොළඹ 05.

**වගඋත්තරකාර පාර්ශවය** : විදුහල්පති,
රාජකීය විද්‍යාලය,
කොළඹ 07.

**<u>පැමිණිලි අංකය : එච්ආර්සී/197/19</u>**

**පැමිණිල්ල:**

පෙත්සම්කරු ඔහුගේ එන්. එම්. උමර් යන දරුවා වගඋත්තරකාර කොළඹ රාජකීය විද්‍යාලයට 2019 වසරේ පළමු ශ්‍රේණියට ඇතුලත් කිරීම සඳහා යොමු අංක RC/S/19/6346 ගෘහ මූලික පදනම යටතේ අයදුම්පත් ඉදිරිපත් කල බව පවසා සිටියි. ඔහු 2018-08-16 වන දින සම්මුඛ පරීක්ෂණයට පෙනී සිට ලකුණු 71ක් ලබා ගෙන ඇති බව පවසා සිටියි. තවද එම වසරේ කොළඹ රාජකීය විද්‍යාලයට ගෘහ මූලික ගණය යටතේ ළමුන් ඇතුලත් කිරීමේ අවම ලකුණු ප්‍රමාණය 57 බව පවසා සිටියි. ඔහුගේ දරුවා තෝරා ගත් ළමුන්ගේ නාම ලැයිස්තුවේ නම නොතිබීම හේතුවෙන් අභියාචනා හා විරෝධතා පරීක්ෂණයට අභියාචනයක් ඉදිරිපත් කිරීමෙන් අනතුරුව 2018-12-25 වන දින අභියාචනා මණ්ඩලය ඉදිරියේ පෙනී සිටි බවත්, ඉන් අනතුරුව ද අවසන් ලැයිස්තුව 2019-01-04 වන දින ප්‍රසිද්ධ කරන ලද නමුත්, එම ලේඛණයට ද අනුව පෙත්සම්කරුගේ දරුවා තෝරා ගෙන නොමැති බව ඔහු පවසා සිටියි.

පෙත්සම්කරු ඔහුගේ දරුවා වගඋත්තරකාර පාසලට තෝරා නොගැනීම පිළිබඳව 2019-01-17 වන දින මෙම පැමිණිල්ල ඉදිරිපත් කරමින් ඔමුට සිදු වී ඇති මෙම අසාධාරණය සම්බන්ධයෙන් සාධාරණයක් ඉටු කර දෙන ලෙසත්, වගඋත්තරකාර පාර්ශවය විසින් ඔහුගේ මූලික අයිතිවාසිකම් කඩ කර ඇති බවට ප්‍රකාශයට පත් කරන ලෙසත් කොමිෂන් සභාවෙන් ඉල්ලා ඇත.


| | | | | | | | |
|---|---|---|---|---|---|---|---|
| ප්‍රධාන කාර්යාලය / பிரதான அலுவலகம் / Head Office | 14, ආර්. ඒ. ද මෙල් මාවත, කොළඹ - 04. / 14, ஆர்.ஏ.த. மெல் மாவத்தை, கொழும்பு - 04. / 14, R. A. De Mel Mawatha, Colombo - 04. | සභාපති / தவிசாளர் / Chairperson | 011-2505451 | ෆැක්ස් / தொலைநகல் / Fax | 011-2505541 / 74 | ඊමේල් / மின்னஞ்சல் / E-mail | sechrc@gmail.com |
| දුරකථන / தொலைபேசி / Telephone | 94-11-2505580 / 81 / 82 | ලේකම් / செயலாளர் / Secretary | 011-2505521 | ක්ෂණික / துரித அழைப்பு / Hotline | 1996 | වෙබ් / இணையம் / Web | www.hrcsl.lk |

මෙම පැමිණිල්ල පිලිබඳව කොමිසන් සභාව විසින් 2019-04-01 වන දින සහ 2019-05-13 යන දින වල පරීක්ෂණ සිදු කර ඇත. එහිදී පෙත්සම්කරු තවදුරටත් කියා සිටින්නේ සම්මුඛ පරීක්ෂණ මණ්ඩලයේ සාමාජිකයන් විසින් 2018-11-21 වන දින පළමු ස්ථානීය පරීක්ෂණය කල බවත්. ඒ අවස්ථාවේදී සම්මුඛ පරීක්ෂණ මණ්ඩලයේ සාමාජිකයින් ඔහු සමග සාකච්ඡා කර කිසිදු ගැටළුවක් නොමැති බව පවසා සිටි අතර. ඉන් පසුව සම්මුඛ පරීක්ෂණ මණ්ඩලය විසින් දෙවන ස්ථානීය පරීක්ෂණය 2018-11-22 වන දින සිදු කළ අතර. එදින පෙත්සම්කරුගේ බිරිද සහ දරුවාට අසනීප තත්වයක් තිබූ බැවින්. ඒ සඳහා බෙහෙත් ගැනීමට පිටව ගොස් සිටි බවට පවසා සිටියි.

**වගඋත්තර පාර්ශවයේ කරුණු දැක්වීම :-**

2018-12-28 වන දින රාත්‍රී 8.30ට පමණ නැවත ඔහුගේ නිවසට අභියාචනා හා විරෝධතා පරීක්ෂණ මණ්ඩලය විසින් ස්ථානීය පරීක්ෂණය සිදු කල බවත්. එම අවස්ථාවේදී ද පෙත්සම්කරු නිවසේ සිටි බවත් කියා සිටියි. 2019-05-13 වන දින කොමිෂන් සභාව ඉදිරියේ පැවැත් වූ පරීක්ෂණයට වගඋත්තරකාර පාර්ශවය වෙනුවෙන් පෙනී සිටි ටී.ඩී.සී.පී. අමරතුංග ගුරු මහතා පවසා සිටියේ පෙත්සම්කරුගේ අයදුම්පතට හා ලිපිගොනුව ලකුණු 71ක් ලබා දුන් පසුව ස්ථානීය පරීක්ෂණය සිදු කල බවත්. 2018-11-21 වන දින කරන ලද ස්ථානීය පරීක්ෂණයේදී පෙත්සම්කරු අයදුම්පත්‍රයේ සඳහන් මෙම නිවස මහල් දෙකකින් යුතු කුඩා නිවසක් බවත්. එහි පවුල් 03ක් පදිංචි වී සිටින බවට නිරීක්ෂණය වූ බවත්. එදින දී පෙත්සම්කරු සහ ඔහුගේ බිරිඳත්. දරුවාත් සිටි නමුත් අසල්වාසීන් විසින් ඔවුන් මෙහි පදිංචියේ නොමැති බව පවසා සිටි බවද දන්වා සිටියි. 2018-11-22 වන දින දෙවන ස්ථානීය පරීක්ෂණයේදී පෙත්සම්කරු නොසිටි බව අනාවරණය වූ නිසා ඔහුගේ නම පොරොත්තු ලේඛණයෙන් ඉවත් කර ප්‍රසිද්ධ කරන ලද බවත්ය.

තවදුරටත් වගඋත්තරකරු පවසා සිටින්නේ අභියාචනා හා විරෝධතා පරීක්ෂණ මණ්ඩලය විසින් සිදු කරන ලද ස්ථානීය පරීක්ෂාවේදී පෙත්සම්කරු ඔහුගේ බිරිඳ. දරුවා ද සිටි බව නිරීක්ෂණය කරන ලද බවත්ය.

තවද වගඋත්තරකරු කියා සිටින්නේ අභියාචනා මණ්ඩල සාමාජිකයින් 05 දෙනෙකු ස්ථානීය පරීක්ෂාවට ගිය අතර. එහිදී පෙත්සම්කරු සහ ඔහුගේ පවුල කුඩා දෙමහල් නිවසක ජීවත් වන බවද අසල්වාසීන් විසින් පෙත්සම්කරු එම ස්ථානයේ පදිංචියේ නොමැති බව ප්‍රකාශ කර සිටියි.

**නිරීක්ෂණය :**

ඉහත පෙත්සම්කරුගේ වාචික දේශණය සහ මුල් පැමිණිල්ලේ සඳහන් කරන ලද කාරණා සහ පැමිණිල්ල සමග අමුණා ඇති සත්‍ය පිටපත් සහිත ලේඛණ වල පරීක්ෂා කිරීමේදී අනාවරණය වූයේ ඉහත කී ලිපිනයේ ජීවත් වන බවත්ය. පෙත්සම්කරුගේ.

01. දරුවාගේ 7945 අංක දරණ උප්පැන්න ලියාපදිංචි කිරීමේ ලේඛණය

02. පෙත්සම්කරුගේ 2000 03 12 දිනැති ජාතික හැඳුනුම්පත

03. 2018 06 07 දිනැති ග්‍රාම නිලධාරී විසින් නිකුත් කරන පදිංචිය හා චරිතය පිලිබඳ සහතිකය

04. ජන්ද හිමි නාම ලේඛණය අඛණ්ඩව 2013 සිට 2017 දක්වා ඉහත කී ලිපිනයෙහි පදිංචි වී සිට ඇති බවට අනාවරණය වේ.

මීට අමතරවද පෙත්සම්කරුගේ දරුවාගේ නමට තිබෙන කොමපත් බැංකු පොත. පෙත්සම්කරුගේ දරුවා ගිය පෙර පාසල් ප්‍රගති තොරතුරු ලේඛණ වලින්ද පෙත්සම්කරු සහ ඔහුගේ පවුලේ අය අංක 257/2/ඒ යන ලිපිනයෙහි සිටි බව වඩාත් පැහැදිලි වේ.

පෙත්සම්කරුට සම්මුඛ පරීක්ෂණ මණ්ඩලය සහ අභියාචනා විරෝධතා පරීක්ෂණ මණ්ඩලය විසින් ලකුණු 71ක් බවට තහවුරු කර ඇති බවට ද 2009 වසරේ කොළඹ රාජකීය විද්‍යාලයට ගෘහ මූලික පදනම මත ළමුන් ඇතුලත් කිරීමේ අවම ලකුණු ප්‍රමාණය 57ක් බවද අනාවරණය වේ.

වගඋත්තරකරුගේ කරුණු දැක්වීම මත කොමිෂන් සභාවට අනාවරණය වූ කරුණු වූයේ පෙත්සම්කරු පදිංචි වී සිටින නිවාස ඉතා කුඩා දෙමහල් නිවසක් බවත්. එම නිවාස සංකීර්ණය තුළ පවුල් කිහිපයක් ජීවත් වන බවත්. අසල්වාසීන් විසින් මෙම පෙත්සම්කරු සහ ඔහුගේ පවුලේ අය එහිදි පදිංචි නොමැති බවට පවසා එකී හේතුවක් මත පෙත්සම්කරුගේ අයදුම්පත්‍රය ප්‍රතික්ෂේප කල බවත්ය. මෙහිදී කොමිෂන් සභාව ඉදිරියේ තිබෙන විසදිය යුතු කාරණය වන්නේ පෙත්සම්කරුට.

| | |
|---|---|
| සම්මුඛ පරීක්ෂණයේදි පදිංචියට ලකුණු | 23/30 ක්ද. |
| පදිංචිය තහවුරු කිරීමට ඉදිරිපත් කරන ලද අතිරේක ලේඛණ සඳහා ලකුණු | 3/5ක්ද. |
| ජන්ද නාම ලේඛණයේ අඛණ්ඩව වසර 05ක් සඳහා පෙත්සම්කරුගේ හා බිරිඳගේ නම ලියාපදිංචි වීමට ලකුණු | 25/25ක්ද. |

ලබා දී තිබියදී තවද පෙත්සම්කරු විසින් වගඋත්තරකාර සම්මුඛ පරීක්ෂණයට ඉදිරිපත් කරන ලද අනිකුත් ලේඛණ වල පවා එකම ලිපිනය තිබියදී පෙත්සම්කරුගේ පදිංචිය ලේඛණ වලින් ඉතා පැහැදිලිව තහවුරු වී තිබියදීත්. සම්මුඛ පරීක්ෂණ මණ්ඩලයේ සාමාජිකයන් සහ ඉන් අනතුරුව අභියාචනා හා විරෝධතා මණ්ඩලයේ සාමාජිකයන් විසින් ස්ථානීය පරීක්ෂණය කල අවස්ථාවේදි පෙත්සම්කරු සහ ඔහුගේ පවුලේ අය ඔහු විසින් පාසලට ලබා දුන් ඉහත කී ලිපිනයේ පදිංචි වී සිටි නම් ඉන් එහා වගඋත්තරකාර පාර්ශවය පෙත්සම්කරුගෙන් බලාපොරොත්තු වන්නේ කුමක්ද යන්න ගැටළුව මතු වේ.

වගඋත්තරකාර පාර්ශවය ලේඛණ වලට සහ ස්ථානීය පරීක්ෂණයට සීමා වී පෙත්සම්කරුගේ පදිංචිය තවදුරටත් තහවුරු කරනවාද නැතිනම් පෙත්සම්කරු ජීවත් වන නිවාස ඉතා කුඩා නිවාස සහ එහිදි පවුල් කිහිපයක් ජීවත්වෙනවාද සහ පෙත්සම්කරුගේ අසල්වැසියන්ගේ ප්‍රකාශයන් පිළිගෙන පෙත්සම්කරු එකී ලිපිනයෙහි ජීවත් නොවන බව පිළිගන්නවාද යන ප්‍රශ්නයේදී ලිපි ලේඛණ වලට සහ ස්ථානීය පරීක්ෂණයේ පෙත්සම්කරුගේ පදිංචිය තහවුරු වීම පදනම් වී පෙත්සම්කරුගේ දරුවාට වගඋත්තරකාර පාසලේ අධ්‍යාපනය හැදෑරීමට අවස්ථාව ලබා දීමට තිබෙන බව මානව හිමිකම් කොමිෂන් සභාවේ මතය වේ.

ජනාකීර්ණ ප්‍රදේශයක් වන කොළඹ නගරය සහ ඉන් අවට ප්‍රදේශ වල ජනතාව කුඩා නිවස් වල ජීවත් වීම සහ එකම නිවසේ පවුල් කිහිපයක් ජීවත් වීම සාධාරණ කාරණයක් වේ. තවද ජනතාවගේ තත්වය සෑම දෙනාටම එක හා සමාන ආකාරයට නොතිබීම තුලින්ද විවිධ මට්ටමේ ආර්ථික අපහසුතාවයන් සමග ජනතාව ජීවත් වෙද්දී සියලු දෙනාම සියලු පහසුකම් සහිත නිවසේ ජීවත් වේද කියා බලාපොරොත්තු විය නොහැකි කාරණයක් වේ.

තවද පෙත්සම්කරුගේ අසල්වැසියන්ගේ කීම කෙතරම් දුරට පිළිගත හැකි ද යන්න ගැටළු සහගතය. මෙහිදී කුඩා නිවස තුළ ජීවත් වීම සහ අසල්වැසියන්ගේ කීම සැක සහිත කාරණයක් වන අතර. පෙත්සම්කරු විසින් ඉදිරිපත් කර තිබූ ලේඛණ නිවැරදි බව පිළිගැනීම ද කොමිෂන් සභාවේ මතය වේ.

අංජලි තිවක් පුශ්පරාජා රොහාන් සහ රොහන් රාහුල් ආයුෂ්මත් එදිරිව අධ්‍යාපන අමාත්‍ය සහ අධ්‍යාපන අමාත්‍ය ඇතුළු පිරිස SC/FR Application 06/2017 ශ්‍රේෂ්ඨාධිකරණ නඩුවේදී විපින් ඉක් මලල්ගොඩ විනිසුරුතුමා මෙසේ සඳහන් කරයි.

Even though this court is reluctant to make any remark on the above observation by the team which went for the inspection, I cannot ignore the fact that there are people who live with lots of hardships and therefore one cannot expect everybody in this country to have a bedroom with a bed in their houses.

මෙහිදී විනිසුරුතුමා සඳහන් කර සිටින්නේ ජනතාව නොයෙකුත් ගැටළු සමග ජීවත් වන අවස්ථාවකදී සියලු දෙනාම එක හා සමාන පහසුකම් සහිත ජිවිතයක් ගත කිරිමට නොහැකි වීම පිළිබඳයි. එම නඩුවේ ම විනිසුරුවරයා මෙසේ කියා සිටියි. " The Ordinary meaning that is given to Residence is the place where an individual eats, Drinks, and sleeps or where his family or his servants eat, drink and sleep. ( Wharton's law Lexicon)".

නිවස යනු කුමක්ද පැහැදිලි කිරිමේදී පුද්ගලයෙක් ආහාර ගැනීම බීම සහ නිදා ගැනීම හෝ ඔහුගේ පවුලේ අය හෝ සේවකයන් ආහාර ගැනීම බීම සහ නිදා ගැනීමේ තැන විතරක් ද යන්න පවසා සිටියි.

එබැවින් ඉහත කී නඩු තීන්දුවේ විපින් මලල්ගොඩ විනිසුරුතුමා ප්‍රකාශ කරපු ආකාරයට බැලූ විට නිවස යනු ඉතා කුඩා හෝ එම නිවස තුළ පවුලේ කිහිපයක් ද ජීවත් වීමට ඉඩ ඇත. ඉහත කී කරුණු කාරණා සලකා බැලීමේදී පෙත්සම්කරු එකී ලිපිනයෙහි අඛණ්ඩව පදිංචි වී සිටින බවත්, පෙත්සම්කරුගේ අයදුම්පත්‍රය පිළිබඳව වගඋත්තරකාර පාර්ශවය නිතියේ රාමුව සිට ක්‍රියා කර නොමැති බව තදුරටත් පෙනි යයි. මෙහිදී වගඋත්තරකාර පාර්ශවය පෙත්සම්කරු ඉදිරිපත් කල සියලු ලේඛණ සලකා බැලුවේ නම් පෙත්සම්කරුගේ දරුවා කොළඹ රාජකීය විද්‍යාලයට ඇතුලත් කිරිම සුදුසු බව කොමිෂන් සභාවට නිරීක්ෂණය වේ.

නවද ගංග මූලික පදනම මත 2019 වසරට ළමුන් ඇතුළත් කිරීමේදි අවම ලකුණු වූයේ 57ක් වන අතර, සම්මුඛ පරීක්ෂණ මණ්ඩලය සහ අභියාචනා හා විරෝධතා මණ්ඩලය විසින් ලකුණු 71ක් ලබා දී තිබියදී සැකයට භාජනය වූ කරුණක් සැලකිල්ලට ගෙන පෙත්සම්කරුගේ දරුවාට තිබූ අයිතිය අහිමි කිරීම සුදුසු නොවන බවටත් කොමිෂන් සභාවට නිරීක්ෂණය වේ.

**නිගමනය :**

මෙම සමස්ථ කරුණු අනුව 1978 ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 3 වන පරිච්ඡේදයේ 12.1 වගන්තියේ සඳහන් නීතිය ඉදිරියේ සමානත්වයෙන් සැළකීම වගඋත්තරකාර පාර්ශවය විසින් උල්ලංඝණය කර ඇති බවට මානව හිමිකම් කොමිෂන් සභාව මෙයින් නිගමනය කරනු ලැබේ.

පෙත්සම්කරුගේ දරුවා වන නලීර් මොහොමඩ් උමර් දරුවා කොළඹ රාජකීය විද්‍යාලයට ඇතුලත් විය යුතු නියමිත ශ්‍රේණියට ඇතුලත් කළ යුතු බවට මෙයින් නිර්දේශ කරනු ලැබේ.

2022. 02. 21 වන දිනට පෙර මෙකී නිර්දේශය ක්‍රියාත්මක කර ඒ සම්බන්ධ වාර්තාවක් කොමිෂන් සභාව වෙත ලැබීමට සලස්වන ලෙස 1996 අංක 21 දරණ ශ්‍රී ලංකා මානව හිමිකම් කොමිෂන් සභා පනතේ 15 වන වගන්තිය ප්‍රකාරව වගඋත්තරකරුවන් වෙත දන්වමු.

එසේම එකී නිර්දේශය ක්‍රියාත්මක වීම හෝ නොවීම සම්බන්ධව පැමිණිලිකරු විසින්ද ඉහත දින සිට සතියක කාලයක් තුළ කොමිෂන් සභාවට දැනුම් දිය යුතු වන අතර, එදිනට පෙර අදාල දැනුම්දීම සිදු නොකරන්නේ නම් පසුව ඉදිරිපත් කරනු ලබන ඉල්ලීම් සම්බන්ධයෙන් සලකා නොබලන බවද වැඩිදුරටත් දන්වමු.

අනුසූයා ෂන්මුගනාදන්,
කොමසාරිස්,
ශ්‍රී ලංකා මානව හිමිකම් කොමිෂන් සභාව.

ම.හේ. නිමල් කරුණාසිරි,
කොමසාරිස්,
ශ්‍රී ලංකා මානව හිමිකම් කොමිෂන් සභාව.

ස/- Ms. Anusuya Shanmuganathan
Commissioner
Human Rights Commissioner of Sri Lanka

Dr. W.H. Nimal Karunasiri
Commissioner
Human Rights Commission of Sri Lanka

ලේකම්, - සුදුසු කටයුතු සඳහා
අධ්‍යාපන අමාත්‍යංශය,
ඉසුරුපාය, බත්තරමුල්ල.